කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

ගණිතය
(I කොටස)

07 වන ශ්‍රේණිය

නම/ විභාග අංකය ....

පැය දෙකයි
Two hour

* ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. 2 × 20 = ලකුණු 40කි.

(01) සුළු කරන්න. $2.05 + 1.7$

(02) දී ඇති රූපයේ සමමිතික අක්ෂ කීයද? ඒවා ලකුණු කරන්න.



(03) සුළු කරන්න. $5\frac{1}{4} + 1\frac{1}{2}$

(04) A = {1 සිට 10 තෙක් ඔත්තේ සංඛ්‍යා} නම්A කුලකය අවයව ලැයිස්තු ගත කිරීමක් ලෙස ලියා දක්වන්න.

(05) 73 341 යන සංඛ්‍යාවේ ඉලක්කම් දර්ශකය සොයා එය 9න් ඉතිරි නැතිව බෙදේද? නොබෙදේද යන්න ලියා දක්වන්න.

(06) හිස්තැන් පුරවන්න.
2kg 875 g = ... kg= .... g

(07) වේලාව 9.30 දක්වන විට ඔරලෝසු මුහුණතක පැය කටුව හා මිනිත්තු කටුව අතර කෝණය කවර වර්ගයේ කෝණයක් සාදයිද යන්න රූප සටහනකින් දක්වන්න.

(08) රූපයේ පරිමිතිය වීජීය ප්‍රකාශනයක් ඇසුරෙන් ලියා දක්වන්න.



(09) සුළු කරන්න. (-7) + (+5)

(10) $x \times x \times y \times x \times y$ දර්ශක ආකාරයෙන් ලියන්න.

(11) පහත සඳහන් වර්ෂ වලින් අධික අවුරුදු <u>නොවන</u> වර්ෂ ලියන්න.
2012 , 2000 , 2200 , 1996 , 2002 , 1984

(12) හිස්තැන් පුරවන්න.



(13) පහත දැක්වෙන අනුපාත කට්ටලය තුළ ඊට නොගැලපෙන එක් අනුපාතයක් ඇත. තුල්‍ය අනුපාත පිළිබඳ දැනුමෙන් එම අනුපාතය තෝරන්න.
3 : 5 , 6 : 10 , 15 : 25 , 12 : 15 , 30 : 50

(14) එකතු කරන්න.

	kg	g
	5	75
+	4	35

(15) 12 m දිග රෙදි ප්‍රමාණයක් සමාන කැබලි පහකට වෙන් කළේ නම් එක් කැබැල්ලක දිග කොපමණද?

(16) 8 , 10 , 12 යන සංඛ්‍යාවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

(17) පහත සඳහන් භාග ආරෝහණ පිළිවෙලට ලියා දක්වන්න.

$\frac{2}{3}$, $\frac{3}{4}$, $\frac{1}{2}$

(18) සුළු කරන්න. (i) $3.75 \div 10$ (ii) $235 \div 1000$

(19) කමලාගේ පියා ඇයට වඩා අවුරුදු 28 මාස 02 දින 25ක් වයසින් වැඩිමහල්ය. කමලාගේ උපන් දිනය 1991.08.02 නම් පියාගේ උපන්දිනය කවදාද?

(20) AB හා CD රේඛා සමාන්තර දැයි පරීක්ෂා කිරීමට යොද ගන්නා ගණිත උපකරණ දෙකක් නම් කරන්න.



7 වන ශ්‍රේණිය ගණිතය (II කොටස)

* පළමුවන ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට වෙනත් කඩදාසියක පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු 16ක් ද, අනෙක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමිවේ.

(01) පන්ති කාමරයේ දී ඔබ විසින් සකසන ලද දශම, අනුපාත හා ප්‍රතිශත ඇතුළත් ප්‍රශ්න හා පිළිතුරු සහිත පොත් පිංච සිහිපත් කරගෙන පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(a) I. එදිනෙදා ජීවිතයේ දී දශම, අනුපාත හා ප්‍රතිශත භාවිතා වන අවස්ථා සඳහා උදාහරණ එක බැගින් ලියා දක්වන්න.

II. සෘජුකෝණාස්‍රයක් හා වෘත්තයක් භාවිතා කර පොත් පිංචෙහි පිටකවරයට කරන ලද නිර්මාණයේ දළ සටහනක් ඇඳ පෙන්වන්න.

III. O කේන්ද්‍රය වූ වෘත්තයේ අඳුරු කළ කොටස සහ ඉතිරි කොටස අතර අනුපාතය ලියා දක්වන්න.



මිශ්‍ර පලතුරු බීම

අඹ : දොඩම් : අන්නාසි
2 : 3 : 5

840 ml

(b) ඉහත රූපයේ දැක්වෙන්නේ මිශ්‍ර පලතුරු බීම බෝතලයක අලවා ඇති පත්‍රිකාවකි.

I. මෙහි වැඩියෙන් අඩංගු වන පලතුරු වර්ගය කුමක්ද?

II. මෙහි අඩංගු දොඩම් යුෂ ප්‍රමාණය මුළු බීම ප්‍රමාණයෙන් භාගයක් ලෙස දක්වන්න.

III. මෙම මිශ්‍ර පලතුරු බීම 840 ml ක අඩංගු දොඩම් යුෂ ප්‍රමාණය මිලිලීටර කීයද?

IV. මෙහි අඩංගු අඹ යුෂ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස ලියා දක්වන්න.

V. මෙම පලතුරු බීම බෝතලයෙන් බීම 10l ක් සෑදිය හැකි අතර වීදුරුවකට අල්ලන බීම ප්‍රමාණය 250 ml කි. එක් අයෙකුට එක බීම වීදුරුව බැගින් සකසන ලද නම් මෙම බීම ප්‍රමාණය කී දෙනෙකුට බෙදිය හැකිද?

(02) (a) සුළු කරන්න.

I. 0.25×8 II. 1.75×1000

(b) පොතක මිල රු.x ද පෑනක මිල රු. y ද වේ. මකනයක මිල පෑනක මිලට වඩා රු.2/= ක් අඩුය.

I. මකනයක මිල
II. පොත් දෙකක හා මකනයක මිල
III. පෑන් දෙකක සහ මකනයක මිල සඳහා වීජීය ප්‍රකාශන ලියා දක්වන්න.

(c) $x = 4$ $y = 3$ නම් $3x - 2y$ ප්‍රකාශනයේ අගය කුමක්ද?

(03) හිස්තැන් පුරවන්න.

(a) $\frac{3}{7} = \frac{3 \times \square}{7 \times \square} = \frac{6}{\square}$

(b) නිමල් තමාට ලැබුණු චොකලට් එකකින් $\frac{1}{4}$ ක් මල්ලීට ද $\frac{2}{5}$ ක් නංගීට ද දුන්නේය.

I. මල්ලීට හා නංගීට ලැබුණු ප්‍රමාණය චොකලට් එකෙන් කවර භාගයක්ද?
II. නිමල්ට ඉතිරි වන චොකලට් ප්‍රමාණය චොකලට් එකෙන් කවර භාගයක්ද?
III. වැඩි චොකලට් ප්‍රමාණයක් ලැබුණේ කාටද? පිළිතුරු හේතු සහිතව පැහැදිලි කරන්න.
IV. චොකලට් එකක වටිනාකම රු.100/= ක් නම් නිමල්ට ලැබුණු ප්‍රමාණයේ වටිනාකම කොපමණද?

(04) කවකටුව හා සරල දරය භාවිතයෙන් පහත සඳහන් නිර්මාණය කරන්න.

I. O කේන්ද්‍රය වූ ද අරය 3cm ක් වූද වෘත්තයක් අඳින්න.

II. එහි ඕනෑම AB විශ්කම්භයක් අඳින්න.

III. AB හි දිග කොපමණද?

IV. AB ට ලම්බක වූ CD නම් තවත් විශ්කම්භයක් අඳින්න.

V. A , C , B , D යා කර ලැබෙන චතුරස්‍රය කුමන නමකින් හැඳින්වේද?

VI. ඉහත (V) හි පිළිතුර ලබාගැනීමට ඔබ අනුගමනය කළ පියවර ලියන්න.

(05) (a) I. මෙම රූපයේ දී ඇති මිනුම් අනුව x හි අගය සොයන්න.



II. මුළු රූපයේ පරිමිතිය කොපමණද?

III. මෙම රූපයේ වර්ගඵලය ගණනය කරන්න.

(b) 30m ක් දිග කම්බි රෝලකින් 2m 45cm ක් දිගැති කම්බි කැබලි 8ක් කපා වෙන් කරන ලදී.

I. එම කැබලි 8හි මුළු දිග කොපමණද?

II. ඉතිරි කම්බි ප්‍රමාණය සොයා එම ප්‍රමාණය මීටර් වලින් ප්‍රකාශ කරන්න.

(06) (a) ඝනකාභ හැඩැති මාළු ටැංකියක දිග, පළල හා උස පිළිවෙලින් 50cm, 40cm හා 30cm වේ.

I. මාළු ටැංකියට අල්ලන මුළු ජල පරිමාව මිලි ලීටර කියද?

II. එම ජල පරිමාව ලීටර වලින් සොයන්න.

(b) දී ඇති බණ්ඩාංක තලයේ A, B හා C ලක්ෂ්‍යය ලකුණු කොට පිළිවෙලින් යා කොට ඇත.

I. B ලක්ෂ්‍යයේ බණ්ඩාංක පටිපාටිගත යුගලයක් ලෙස ලියා දක්වන්න.

II. මෙම රේඛාව මත ඇති තවත්ලක්ෂ්‍යයක බණ්ඩාංක ලියා දක්වන්න.

III. මෙම බණ්ඩාංක වල ඇති විශේෂ ලක්ෂණය කුමක්ද?



IV. බණ්ඩාංක තලය උත්තර පත්‍රයේ පිටපත් කර A , B හා C ලක්ෂ්‍යවල x හා y බණ්ඩාංක අගයයන් එකිනෙක මාරුකොට D , E හා F ලෙස ලකුණු කොට යා කරන්න.